# 2023/04/27 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/04/27 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා, කාර්මික නිලධාරී ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරී කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරී පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රාණුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/03/31 දිනැති පසුගිය කමිටු රැස්වීම වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කලාප භාර විමර්ශන නිලධාරී ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා යෝජනා කළ අතර එම යෝජනාව ප්‍රජා සංවර්ධන නිලධාරී ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා ස්ථිර කළේය.

මීළඟට, න්‍යාය පත්‍රාණුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

01) ගමන් වියදම්, අතිකාල දීමනා හා ගෙවීම් වවුචර්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වවුචර්පත්

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත්

| අනු අංකය | නම සහ විස්තරය | ගෙවන මුදල(රු:) | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | ආර්.එම්.අමරසිංහ මයා, මාර්ග කම්කරු - සතිපොල බදු මුදල් අයකිරීමට යාම වෙනුවෙන් 2023 මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | ටී.එම්.ඩී.එම්.කුමාරිහාමි මිය, සංවර්ධන නිලධාරී - පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ රාජකාරිය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට යාම වෙනුවෙන් 2023 මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 690.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | ඩී.එම්.නන්දසේන මයා, කාර්යාල කාර්ය සහයක - පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ රාජකාරිය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට යාම වෙනුවෙන් 2023 මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 690.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | ඩී.එම්.ප්‍රේමාවති මිය, මහජන පුස්තකාලය, පිටමාරුව - 2023 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මස පිටමාරුව සතිපොළ බදු මුදල් එකතු කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - ආදායම් එකතු කිරීමට යාම වෙනුවෙන් 2023 පෙබරවාරි හා මාර්තු මස සඳහා ගමන් වියදම් ගෙවීම. | 5,000.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | එච්.පී.එස්.කුමාරි මිය, සංවර්ධන නිලධාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව - 2022 භාණ්ඩ සමීක්ෂණය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාවට යාම වෙනුවෙන් 2023 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 12,320.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | එච්.පී.එස්.කුමාරි මිය, සංවර්ධන නිලධාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව - 2022 භාණ්ඩ සමීක්ෂණය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාවට යාම වෙනුවෙන් 2023 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මස අතිකාල දීමනා ගෙවීම. | 5,593.33 | නිර්දේශ කරන ලදී. |
| 08. | හේෂාන් ඉන්ජිනියරින් වර්කස්, 16 කණුව, ඉමකඳුර, මීගහකිවුල - 2023 වසරේ මීගහකිවුල අවුරුදු පොළ 2023.04.12 දින | 1,500.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | පැවැත්වීම සම්බන්ධව ජනතාව හා වෙළඳ මහතුන් දැනුවත් කිරීම සඳහා ශබ්දවාහිනි යන්ත්‍රය ලබා ගැනීමේ බිල්පත් පියවීම. | | |
| 09. | හේෂාන් ඉන්ජිනියරින් වර්කස්, 16 කණුව, ඉමකඳුර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් හිඟ ජල ගාස්තු පියවීම සඳහා පාරිභෝගික මහතුන් දැනුවත් කිරීම සඳහා ශබ්දවාහිනි යන්ත්‍රය ලබා ගැනීමේ බිල්පත් පියවීම. | 1,500.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි හා මාර්තු මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | කළමනාකරු, ඉම්ටියාස් පකීර්දීන්, පහල වීදිය, බදුල්ල - අප සභාව සඳහා අවශ්‍ය වූ රබර් මුද්‍රා 02ක් සැකසීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 1,150.00 | නිර්දේශ කරන ලදී. |
| 12. | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන දොරටුව දෙපස මල් පාත්ති සකස් කිරීම සඳහා හා පොදු පහසුකා මධ්‍යස්ථානයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 11,919.00 | නිර්දේශ කරන ලදී. |
| 13. | කළමනාකරු, නවිඳු පොත්හල, මීගහකිවුල - පෙබරවාරි මස මීගහකිවුල, පිටමාරුව, කලුගහකඳුර පුස්තකාල තුන සඳහා පුවත්පත් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 21,920.00 | නිර්දේශ කරන ලදී. |
| 14. | කළමනාකරු, ඉම්ටියාස් පකීර්දීන්, පහල වීදිය, බදුල්ල - 2023 වර්ෂය සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 27,920.00 | නිර්දේශ කරන ලදී. |
| 15. | රෙජිස්ට්‍රාර් ජනරාල්, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, බදුල්ල - මුද්දර ආදායම් උපලේඛණ සැකසීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම. | 6,700.00 | නිර්දේශ කරන ලදී. |
| 16. | සභාපති, ප්‍රජා ශක්ති ප්‍රජා මණ්ඩලය, අග්ගලාඋල්පත, මීගහකිවුල - සභා අරමුදලින් මීගහකිවුල නගරයේ තාවකාලික කඩ කාමර 5 ඉදිකිරීම ව්‍යාපෘතියේ 10% තැන්පත් මුදල නිදහස් කර ගෙවීම. | 41,044.61 | නිර්දේශ කරන ලදී. |
| 17. | ඩී.එම්.ආර්.යු.කේ.දියානායක මයා, ලංකා ඉන්ධන පිරවුමහල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා අප්‍රේල් මස 01 සිට 15 දක්වා ඉන්ධන සඳහා ගෙවීම. | 82,875.00 | නිර්දේශ කරන ලදී. |

II. 2023 මාර්තු මස 20 වන දිනට පෙර ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත්

- 2021 වර්ෂයේ වවුචර්පත් ණයහිමි ලේඛණයට ඇතුලත් කර ඇත්දැයි සොයා බැලීමෙන් පසු ණයහිමි ලේඛණයේ ඇතුලත් වූ වවුචර්පත් සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තිරණය කරන ලදී.

| අනු අංකය | නම සහ විස්තරය | ගෙවන මුදල(රු:) | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | කළමනාකරු. නවිඳු පොත්හල. මීගහකිවුල - ජනවාරි මස මීගහකිවුල. පිටමාරුව. කලුගහකඳුර පුස්තකාල තුන සඳහා පුවත්පත් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 25,270.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | ආර්.එම්.අමරසිංහ මයා. මාර්ග කම්කරු - සතිපොල බදු මුදල් අය කිරීමට යාම වෙනුවෙන් 2022 ජනවාරි. පෙබරවාරි. මාර්තු. ජුනි. සැප්තැම්බර්. නොවැම්බර්. දෙසැම්බර්. 2023 ජනවාරි. පෙබරවාරි මස ගමන් වියදම් ගෙවීම.(2.500X9) | 22,500.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | බී.එම්.හිරන්ත ලක්ෂාන් මයා. කාර්මික නිලධාරි(පුහුණු) – 2023 | 6,300.00 | නිර්දේශ කරන |

| | | | |
|---|---|---|---|
| | ජනවාරි මස සංයුක්ත දීමනාව ගෙවීම. | | ලදී. |
| 04. | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - 2023 ජනවාරි මස ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | ජේ.එම්.ජේ.කුමාරසිරි මයා, රියදුරු - 2022 මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 2,800.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | ආර්.එම්.පී.අශෝකා මිය, පුස්තකාල සහයක - 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,026.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | ජී.ජී.කසුන් දර්ශන මයා, මහජන පරීක්ෂක - ආහාර සෞඛ්‍ය කටයුතු සඳහා යාම වෙනුවෙන් 2021 ජනවාරි, මාර්තු, අප්‍රේල්, ජුනි මස වල ගමන් වියදම් ගෙවීම. | 3,868.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | එස්.එච්.එල්.වයි.ටී.ටී.ඉසුරු පැතුම් මයා, මහජන පරීක්ෂක - ආහාර සෞඛ්‍ය කටයුතු සඳහා යාම වෙනුවෙන් 2021 ජනවාරි,පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මස වල ගමන් වියදම් ගෙවීම. | 4,000.00 | නිර්දේශ කරන ලදී. |

III. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවකයින්, ආදේශක පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් හා අනියම් සේවකයින් සඳහා 2023 අප්‍රේල් මස වැටුප් ගෙවීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

02) 2022 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කල ලිපිය

- භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම සඳහා පැමිණෙන නිලධාරීන් සඳහා පැමිණීමේ ලේඛණයක් පවත්වා ගෙන යාමට කටයුතු කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.
- 2022 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශය ක්‍රියාත්මක කරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

03) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මාර්තු මස ආදායම් වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

04) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මාර්තු මස වියදම් වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

05) මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ 2023 මාර්තු මස වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

06) මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපිට කඩ කාමරයට විදුලිය සපයා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කල ලිපිය

- මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපිට කඩ කාමරයට විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් නියම කරනු ලබන මුදල ගෙවීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.
- මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය ඉදිරිපිට කඩ කාමරයේ විදුලි නත් ඇදීම(wiring) සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු:150.000.00ක සීමාවකට යටත්ව මිලදී ගැනීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

07) මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල නගරයේ අංක 08 දරණ කඩ කාමරයේ හිඟ කඩ කුලිය ගෙවීම සඳහා සහන කාලයක් ඉල්ලා ඉදිරිපත් කල ලිපිය

- මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල නගරයේ කඩ කාමර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

08) ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය(LDSP) යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදෙන කාර්ය සාධන අරමුදල් ප්‍රදානයන්(PT 2) යොදාගනිමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පිහිටුවා ගැනීම සඳහා ඉදිරිපත් කල ලිපිය

- ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය(LDSP) යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදෙන කාර්ය සාධන අරමුදල් ප්‍රදානයන්(PT 2) යොදාගනිමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පහත පරිදි පිහිටුවීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

**තාක්ෂණික ඇගයීම් කමිටුව**

I. ටී.සෙන්තූර් කුමාර් මයා - දිස්ත්‍රික් ඉංජිනේරු, ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව, බදුල්ල
II. ආර්.එම්.එල්.ජේ.රත්නායක මයා - කාර්මික නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල
III. එස්.එම්.එස්.යූ.සමරකෝන් මයා - සංවර්ධන නිලධාරී, ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව, බදුල්ල

**ප්‍රසම්පාදන කමිටුව**

I. ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය - සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල
II. වී.එන්.කුමාරසිංහ මිය - පරිපාලන නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මීගහකිවුල
III. ඒ.එල්.ඒ.ඩී.චන්දිම මයා - ප්‍රජා සංවර්ධන නිලධාරී, ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව, බදුල්ල
IV. ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මයා - විමර්ශණ නිලධාරී, ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව, බදුල්ල
IV. ආර්.එම්.එල්.ජේ.රත්නායක මයා - තාක්ෂණ සේවා නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල
V. ආර්.එම්.එම්.රත්නායක මිය - සංවර්ධන නිලධාරී, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තූති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) - Nishanthi
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ඒ.එල්.ඒ.ඩී.චන්දිම මහතා (කමිටු සාමාජික) -
4) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
5) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
6) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -